# රුවනිගේ මල් වත්ත



සෙනුදි දහම්සා ජයසුන්දර

# පිදුම

මගේ ආදරණීය මිතුරියන්ට ආදරයෙන් පුදමි.





## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

පෙරවදන

# සුභාශිංසන පණිවිඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලයා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාගියක් කෙට සලකම්ග

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පද්නම වන අතර, එය පෙත් පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත්වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශිලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘතියි මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නෙව, සමස්ත සමාජයට වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම,මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේප ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලපොරොත්තු වෙමි.

මෙම සාමාථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පති තුමිය, ගුරුමණ්ඩලය, සිසු දරුවන් සහ සම්භබන්ද සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ අශිර්වාද්‍ය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සදහ ගන්ථ එළින් දැක්වීම උත්සවය විශිෂ්ට සාර්ථකවයක් ලැබෙනු ඇතැයි ප්‍රාර්තනා කරමි.

සරත් බී. ස්. අභයකෝන්,
ආඩුකකාරවර,මධ්‍යම පළත.
සම්මානිත මහාචාර්ය , පේරාදේණිය විය්වවිද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවිඩය

වත්මන් පාල් පද්ධතිය තුළ දූරුවන් ග්‍රන්ථකරණයට යෙමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය මූලිත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගීවත්යෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්හ සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීම ව්‍යාපෘතිය සංවිදානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය ය, ශිෂ්‍ය දු පුතුන්, සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැන්විමට කැපවූ සියලු දෙනාගේ විශෂ්ට වු උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.
ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දු දරුවන්ට නිදහස්, අනිර්වාමාය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දිමටත් එමගින් අනාගතයේදි බුද්ධිමත් කුසලය පූර්ණ පුරවැසියන් පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිර වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාමාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාමක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගතය දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පදක වේ. ශ්‍රී දළදා සම්දු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදිප් නිලංග දෑල
දියවඩන නිලමේ
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


එකමත් එක ගමක රුවනි කියලා පුංචි ගැහැනු ළමයෙක් ජීවත් වුනා. ඇයගේ පවුලේ අම්මයි තාත්තයි සහ රුවනි ජීවත් වුනා. ඇයට ඉතාම ලස්සන මල් වත්තක් තිබුණා. ඇය එම මල් වත්තට ඉතා ආශා කළා. ඇය උදෑනින් අවදි වී මල් වත්තට ගොස් ඇය වත්තේ තිබෙන මල් වලට වතුර දැමුවා.




තවත් එක් දිනක රුවනි උදෑසනින් අවදි වී මල් වත්තට ගොස් වතුර දැමුවා රුවනිට සිතුණා මල් වත්තේ තවත් මල් ටිකක් පැළ කරන්න.රුවනි ඒ බව අම්මට කිවුවා. රුවනිගේ අම්මා තාත්තාට කියලා රුවනිට මල් පැළ ටිකක් ගෙනත් දුන්නා. ඊට පස්සේ රුවනි ඒ මල් පැළ ටික මල් වත්තේ පැළ කළා.ඊට පස්සේ රුවනි මල් පැළ ටිකටත් වතුර දැමුවා.



රුවනි පාසල් ඇරී නිවසට පැමිණියා. ඇය ඉක්මනින් ම මල් වත්තට ගියා. රුවනි දැක්කා එයා හදපු මල් පැළ ටික පැළ වෙලා.එයා හදපු මල් පැළවලට සමනල්ලු ඇවිත් මල් පැණි බොන විදිහ රුවනි දැක්කා.රුවනිට ගොඩාක් සතුටු හිතුනා.රුවනි එයාගේ අම්මාටත් තාත්තාටත් කිවුවා.



රුවනිට හිටියා පුංචි ලේන් පැටියෙක් ඉතින් ඒ පුංචි ලේන් පැටියාට රුවනි ගොඩාක් ආශා කළා.රුවනිට ඒ ලේන් පැටියව ලැබිලා දැන් සති දෙකක් විතර ගත වුණා.ඒත් ඒ ලේන් පැටියාට රුවනිව දාලා යන්න නම් අදහසක් තිබුන් නෑ.



තවත් එක් දිනක රුවනි මල් වත්තට ගියා. එතකොට රුවනි දැක්කා මල් වත්තේ එක් කොනක ලේන් පැටියාට හොඳටම තුවාල වෙලා වැටිලා ඉන්නවා රුවනි දැක්කා රුවනි ඒ ලේන් පැටියව ඉක්මනින් අතට අරන් ඉක්මනින් රුවනි රුවනිගේ අම්මා ළඟට අරන් ගියා.



රුවනි ඊට පස්සේ ලේන් පැටියාට ප්‍රතිකාර කරා ඊට පස්සේ ලේන් පැටියාට තුවාලය අඩු වුණා.රුවනිගේ අම්මා කිවුවා ලේන් පැටියාගේ අම්මා හොයාගෙන ආවාම අපි ලේන් පැටියාව එයාගේ අම්මාට දෙමු කියලා රුවනිගේ අම්මා කිවුවා.



ඒත් රුවනි කැමති වුනේ නෑ
ලේන් පැටියාව දෙන්න.
ඊට පස්සේ රුවනිගේ අම්මා කිවුවා
එයත් කැමති අපි වගේ ඉන්න කියලා
රුවනිගේ අම්මා කිවුවා.ඊට පස්සේ
රුවනි ඒකට කැමති වුණා.



තවත් දිනක රුවනි ලේන් පැටියාව බලාගෙන ඉන්න කොට ලේන් පැටියාගේ අම්මා කෑගහන සද්දේ රුවනිට ඇහුනා.



රුවනි එතනට ලේන්
පැටියත් එක්ක ගියා.රුවනි දැක්කා
එයාගේ අම්මා මල් වත්තේ තිබෙන
ගසක ඉන්නවා රුවනි ලේන් පැටියව
එයාගේ අම්මට දුන්නා.රුවනිට
ගොඩාක් ස්තූති කළා.



රුවනි ඒ ගැන එයාගේ අම්මාටයි තත්තාටයිකියුවා. ඊට පස්සේ එයාගේ අම්මායි තත්තායි එයාට ගොඩක් හොද කියුවා. ඉතින් එයාගේ මල් වත්ත නිසා ඒ සතාව බේරා ගන්න ලැබුනා.

රුවනි පුංචි කාලේ ඉදලාම පරිසරයට ආදරය කලා . ගහා කොළ වවාන්න. සත්තුන්ටය ආදරය  කරන්න පටන් ගත්තා. අපිත් රුවනි වගේ ගහකොළට ආදරය කරන සත්තුන්ට කරුණාාව දක්වන හොද දරුවෝ වෙමු.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)